සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 33 S I

නම: .............................................

## ඉතිහාසය - I

කාලය පැය එකයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැඟීමට යොදා ගනු ලැබූ පහත සඳහන් මූලාශ්‍ර ග්‍රන්ථ අතරින් මුලින්ම ලියවී ඇති ග්‍රන්ථය කුමක් ද?
(i) දීපවංශය (ii) මහාවංශය (iii) සීහලට්ඨ කථා මහාවංශය (iv) බෝධිවංශය

02. සීගිරි ගී ඇතුලත් කළ හැක්කේ පහත සඳහන් කුමන මූලාශ්‍ර කාණ්ඩයට ද?
(i) සෙල් ලිපි (ii) පර්වත ලිපි (iii) ලෙන් ලිපි (iv) අභිලේඛන

03. ශ්‍රී ලංකාවේ වර්තමානයේ වෙසෙන වැදි ජනතාවට සමාන කර ඇත්තේ,
(i) ඓතිහාසික යුගයේ මානවයින්ට ය. (ii) ගල් යුගයේ මානවයින්ට ය.
(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයින්ට ය. (iv) මුල් ඓතිහාසික යුගයේ මානවයින්ට ය.

04. පහත දැක්වෙන රජවරුන් අතර විදේශීය සම්භවයක් ඇති රජකු ලෙස සැලකෙන්නේ,
(i) දුටුගැමුණු රජතුමා ය. (ii) පණ්ඩුකාභය රජතුමා ය.
(iii) වසභ රජතුමා ය. (iv) නිශ්ශංකමල්ල රජතුමා ය.

05. අතීතයේදී හේන් වගාවේදී සිදු නොකළ කටයුත්තක් වූයේ,
(i) එළිපෙහෙළි කරගත් කැලෑ කොටස් ගිනි තැබීම ය.
(ii) සතුන්ට ඉන් ඉවත් වන ලෙස ශබ්ද නගා කෑ ගැසීම ය.
(iii) විශාල ගස් කපා දැමීම ය.
(iv) වරක් දෙවරක් වගා කොට එම භූමිය අතහැර දැමීම ය.

06. පැරණි සෙල් ලිපියක ''පොවනි රජ'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(i) I වන විජයබාහු රජතුමා ය. (ii) ගමික ය.
(iii) බුද්ධදාස රජතුමා ය. (iv) ප්‍රාදේශීය පාලකයකු ය.

07. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැලැස්මට අනුව සෙල් ලිපි වල ''කන පෙඩික'' නමින් හඳුන්වා ඇති නිලධාරියා කවුරුන් ද?
(i) රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි (ii) වෙළඳ කටයුතුභාර ප්‍රධානි
(iii) චාරිත්‍ර සිරිත් සහ චාරිත්‍ර පිළිබඳ අධිකාරි (iv) කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානි

08. පහත (I) තීරුවේ දැක්වෙන වරායන් හා සම්බන්ධ වූ සිදුවීම් (II) තීරුවේ දැක්වේ. එම වරායන් හා සිදුවීම් නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ( i ) තීරුව | ( ii ) තීරුව |
|---|---|
| 1.දඹකොළ පටුන | A. ලන්දේසීන් මුල් වරට ලංකාවට පැමිණීම. |
| 2.මඩකලපුව | B. දන්තධාතූන් වහන්සේ වැඩමවීම. |
| 3.ලංකා පටුන | C. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීම. |

(i) ACB (ii) BAC (iii) CAB (iv) CBA

09. නිසි කලට සී සෑම නොකරන පුද්ගලයන්ගෙන් කළං පහක දඩයක් අය කළ යුතු බවට නීතියක් ඇතුලත් සෙල්ලිපිය කුමක්ද?
(i) පෙරියන්කුලම සෙල්ලිපිය. (ii) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය
(iii) අනුරාධපුර පුවරු ලිපිය (iv) බුද්ධන්නෙහෙල සෙල්ලිපිය

10. අතීත කෘෂිකාර්මික ජන සමාජයේ මැනීම හා ගණනය කිරීම් වඩාත් වැදගත් වූයේ,
(i) අවකාශය හා බර මැනීමට ය. (ii) බර හා දිග මැනීමට ය.
(iii) දිග හා කාලය මැනීමට ය. (iv) අවකාශය හා කාලය මැනීමට ය.

11. අතීතයේදී රෝගීන් සඳහා විශේෂයෙන් සාදන ලද කැඳ වර්ගය හැඳින් වූ නම කුමක් ද?
(i) දිය කැඳ ය. (ii) යවාගු ය. (iii) ඇඹුල් හඹු ය. (iv) රස උළු කැඳ ය.

12. දෙවන නාගරීකරණයේදී මායා රට සතුරන් පලවා හැර මුල්වරට රාජ්‍ය පාලන මධ්‍යස්ථානයක් ගොඩ නැගූ පාලකයා වන්නේ,
(i) i වන බුවනෙකබාහු රජතුමා ය. (ii) iii වන විජයබාහු රජතුමා ය.
(iii) බෝසත් විජයබාහු රජතුමා ය. (iv) ii බුවනෙකබාහු රජතුමා ය.

• පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරෙන් අංක 13 සහ 14 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A. ඉන්දියාවේ පාණ්ඩ්‍ය අධිරාජ්‍යයෙන් ආධාර සේනා ලබා දීම.
B. ඊජිප්තුවේ සුල්තාන්වරයා වෙත තානාපාති පිරිසක් යැවීම.
C. සිංහල බෝධි වංශය හා අනාගත වංශය වැනි කෘති රචනා කිරීම,
D කාලිංගරායර හා චෝඩගංග නම් සේනාපතීන් යටතේ ආක්‍රමණ එල්ල වීම.
E පාලි භාෂාවෙන් පැවැති පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.

13. කුරුණෑගල යුගයට අයත් සිදුවීම් දැක්වෙන අක්ෂර යුගලය කුමක්ද?
(i) A හා C (ii) B හා D (iii) C හා D (iv) C හා E

14. i බුවනෙකබාහු රජුගේ රාජ්‍ය කාලය හා සම්බන්ධ තොරතුරු ඇතුලත් වන්නේ,
(i) A හා B (ii) B හා C (iii) B හා D (iv) D හා E

15. සද්ධර්මරත්නාවලිය, පූජාවලිය වැනි සාහිත්‍යමය වශයෙන් වැදගත් වූ ග්‍රන්ථ රචනා කරන ලද යුගය වන්නේ,
(i) දඹදෙණිය රාජධානි යුගය යි. (ii) යාපහුව රාජධානි යුගය යි.
(iii) ගම්පොල රාජධානි යුගය යි. (iv) කෝට්ටේ රාජධානි යුගය යි.

16. කෝට්ටේ විජයබාකොල්ලය ඇති වූ අවස්ථාවේදී ඒ සඳහා ආධාර ලබා දුන් උඩරට පාලකයා කවුරුන් ද?
(i) යමසිංහ බණ්ඩාර (ii) ජයවීර බණ්ඩාර
(iii) වීරසුන්දර බණ්ඩාර (iv) තිකපිටියේ බණ්ඩාර

17. දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කර වූ පාලකයා වන්නේ,
(i) තුන්වන විජයබාහු රජතුමා ය. (ii) දෙවන රාජසිංහ රජතුමා ය.
(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා ය. (iv) දෙවන විමලධර්මසූරිය රජතුමා ය.

18. පහත (I) තීරුවේ හා (II) තීරුවේ සඳහන් තොරතුරු ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ( i ) තීරුව | ( ii ) තීරුවේ |
|---|---|
| 1.මහ අදිකාරම් | A. උඩගම්පහ අදිකාරම්. |
| 2.දෙවන අදිකාරම් | B. පල්ලෙ ගම්පහ අදිකාරම්. |
| 3.මුහන්දිරම්වරු | C. අදිකාරම්වරුන්ගේ ආඥා පණිවිඩකරුවන්. |
| 4.කටුපුල්ලේ | D. කෝරලයේ කුල බාර නිලධාරී. |

(i)ACBD (ii)BADC (ii)CBAD (iv)DCBA

19. උඩරට රාජධානියේ රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් වූ ඉඩම් හඳුන්වන ලද නම කුමක්ද?
(i) නින්දගම් ය. (ii) පරවේණිගම් ය.
(iii) ගබඩාගම් ය. (iv) කසීකාරගම් ය.

20. දේශගවේෂණ කටයුතු සඳහා මුලින් ම උනන්දු වූ සාගරබද රටවල් දෙක ලෙස සැලකෙන්නේ,
(i) ඉතාලිය හා ප්‍රංශය යි.
(ii) ප්‍රංශය හා ස්පාඤ්ඤය යි.
(iii) ස්පාඤ්ඤය හා බ්‍රිතාන්‍යය යි
(iv) පෘතුගාලය හා ස්පාඤ්ඤය යි.

21. ශ්‍රී ලංකාව සෙයිලන් නමින් හැඳින් වූයේ ,
(i) පෘතුග්‍රීසීන් විසින් ය.
(ii) ලන්දේසීන් විසින් ය.
(iii) ඉංග්‍රීසීන් විසින් ය.
(iv) අරාබි ජාතිකයන් විසින් ය.

22. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් අනුපිළිවෙලින් සැකසූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
A. පිලිප් ද ඔලිවේරා යටතේ පෘතුග්‍රීසි හමුදාව යාපනය යටත් කිරීම.
B. විජයබාකොල්ලය ඇතිවීම.
C. දන්තුරේ සටන ඇතිවීම.
D. වස්කෝදගාමා ඉන්දියාවේ කැලිකට් වලට ගොඩ බැසීම.

(i) ACDB (ii) BCAD (iii) CBAD (iv) DBCA

23. සීතාවක මායාදුන්නේ රජු සමග සන්ධානයකට පැමිණි යාපනයේ පාලකයා වූයේ,
(i) පරරාජසේකරම් ය.
(ii) සංකිලිය ය.
(iii) එදිරිමාන සිංහම්ය ය.
(iv) පුවිරාජ පණ්ඩාරම් ය.

24. කාර්මික විප්ලවය සමයේ ජල රාමුව හා ජෙනී යන්ත්‍රය යන යන්ත්‍ර දෙකෙහිම මූලධර්ම උපයෝගි කරගෙන නූල් සකස් කිරීම සඳහා නව යන්ත්‍රයක් නිපද වූයේ,
(i) ජේම්ස් හාග්‍රිව්ස් ය.
(ii) සැමුවෙල් ක්‍රෝම්ටන් ය.
(iii) රිචඩ් ආක්රයිට් ය.
(iv) එඩ්මන්ඩ් කාට්රයිට් ය.

25. ආසියාවේ ප්‍රථම වරට අශ්ව කරත්ත මගින් තැපැල් සේවාවක් ආරම්භ කරන ලද රට
(i) ඉන්දියාව යි. (ii) චීනය යි. (iii) ශ්‍රී ලංකාව යි. (iv) ජපානය යි.

26. ඉංග්‍රිසි දූතයෙකු වූ ජෝන් ෆයිබස් ලංකාවට පැමිණෙන විට උඩරට පාලකයා වශයෙන් කටයුතු කළ රජතුමා කවුරුන්ද?
(i) පළමුවන විමලධර්මසූරිය රජතුමා.
(ii) ශ්‍රී විජය රාජසිංහ රජතුමා.
(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා.
(iv) රාජාධිරාජසිංහ රජතුමා.

27. ක්‍රි.ව. 1797 ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ඇතිවූ කැරැල්ලට හේතුවක් නොවූ බදු වර්ගය මින් කුමක්ද?
(i) පොල්ගස් බද්ද. (ii) ඔරු පාරු බද්ද. (iii) මාළු බද්ද. (iv) දුම්කොළ බද්ද.

28. මාසික තෑග්ග නැමැති ග්‍රන්ථය සම්පාදනය කළ මිෂනාරි සංවිධානය කුමක්ද?
(i) ලන්ඩන් මිෂනාරි සංවිධානය.
(ii) ඇමරිකන් මිෂනාරි සංවිධානය.
(iii) චර්ච් මිෂනාරි සංවිධානය.
(iv) බැප්ටිස්ට් සමාගම.

29. සිංහල ජාතිය වැනි පුවත්පත් ඔස්සේ ලාංකිකයන් විචාරයකින් තොරව බටහිර සංස්කෘතිය වැළඳ ගැනීම විවේචනයට ලක්කරන ලද පුද්ගලයා වූයේ,
(i) ජෝන් සිල්වා මහතා ය.
(ii) පියදාස සිරිසේන මහතා ය.
(iii) වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා ය.
(iv) අනගාරික ධර්මපාල මහතා ය.

පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 30 සහ 31 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A. නිල නොලත් සාමාජික පිරිස බහුතරය බවට පත්වීම.
B. සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
C. ජන වාර්ගික නියෝජනය අහෝසි කිරීම.
D. පළාත්බද නියෝජනය හඳුන්වා දීම.
E. උගත් ලාංකිකයෙකු ව්‍යවස්ථාදායක සභාවට ඡන්දයෙන් පත්වීම.

30. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ සිදුවීම් ඇතුළත් වන්නේ,
(i) A හා C (ii) B හා D (iii) B හා E (iv) D හා E

31. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) A හා C (ii) A හා D (iii) B හා C (iv) D හා E

32. ගොවි ජනපද ව්‍යාපාරය, නිදහස් අධ්‍යාපනය වැනි පොදු ජනතාවට බලපාන වැදගත් යෝජනා රැසක් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුනේ පහත කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මෙරට ක්‍රියාත්මක වන යුගයේදී ද?
(i) කෝල්බෲක්. (ii) මැනිං. (iii) ඩොනමෝර්. (iv) සෝල්බරි.

33. කොත්මලේ ජලාශය ඉදිකිරීම සඳහා ආධාර ලබා දුන් රට වන්නේ,
(i) ස්වීඩනය යි. (ii) බ්‍රිතාන්‍යය යි.
(iii) බටහිර ජර්මනිය යි. (iv) නැගෙනහිර ජර්මනිය යි.

පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 34 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
A. රතු ඉන්දියානුවන්ගේ තර්ජන.
B. ප්‍රාදේශීය පාලනයට ඉන්ටෙන්ඩාන්ට් නම් නිළධාරීන් සිටීම.

34. ඇමරිකානු ජනපද බටහිර ව්‍යාප්ත වීමට පැවති බාධකයක් ලෙස
(i) A සත්‍යයි B අසත්‍යයි. (i) A අසත්‍යයි B සත්‍යයි.
(iii) A හා B සත්‍යයි. (iv) A හා B අසත්‍යයි.

පහත A,B,C,D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා 35 සිට 38 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A. - 1. මුද්දර පනත.
2. බ්‍රිතාන්‍ය භාණ්ඩ වර්ජනය.
B. - 1. ප්‍රංශ විප්ලවය.
2. ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහි වීම.
C.- 1. සමාජවාදී දර්ශනය හා ධනවාදී දර්ශනය.
2. දෙවන ලෝක යුද්ධය.
D. - 1. අග්‍රාණ්ඩුකාරධූරය.
2. නාමික ජනාධිපති ධූරය.

35. පළමුවැන්න දෙවැන්නෙහි ප්‍රතිඵලයක් බවට දැක්විය හැකි යුගලය කුමක්ද?
(i) A (ii) B (iii) C (iv) D

36. දෙවැන්න සඳහා පළමුවැන්න හේතුවක් වූ බව දැක්වෙන පද යුගලය කුමක්ද?
(i) A (ii) B (iii) C (iv) D

37. දෙවැන්න නිසා පළමුවැන්න අහෝසි වූ බව දැක්වෙන පද යුගලය කුමක්ද?
(i) A (ii) B (iii) C (iv) D

38. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිම සම්බන්ධතාවක් නොදැක්වෙන පද යුගලය කුමක්ද?
(i) A (ii) B (iii) C (iv) D

39. " නීතියේ සාරය " කෘතිය තුළින් ප්‍රංශ විප්ලවයට බලපෑමක් ඇති කළ දාර්ශනිකයා වූයේ කවුරුන් ද?
(i) රූසෝ. (ii) මොන්ටෙස්ක්‍යු. (iii) වෝල්ටෙයාර්. (iv) නැපෝලියන් බොනපාට්.

40. පහත සඳහන් පුද්ගලයින් අතරින් නොබැදි ජාතීන්ගේ සමුළුව පිහිටුවීමට පුරෝගාමී නොවූ රාජ්‍ය නායකයා වන්නේ ,
(i) මහත්මා ගාන්ධි තුමා ය. (ii) ජවහල්ලාල් නේරු තුමා ය.
(iii) මාර්ෂල් ටිටෝ ය. (iv) අබ්දුල් ගමාල් නසාර් ය.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 33 S II |
|---|---|---|

නම: .............................................

**ඉතිහාසය II**

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනිත්තු දහයයි.

II කොටස

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
  සැළකිය යුතුයි.
  I කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්යය වේ.
  II කොටසින් ප්‍රශ්න 4 ක් ද III කොටසින් එක් ප්‍රශ්නයක්ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

I කොටස

01. (අ) I. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
ලංකා පටුන, කොළඹ, ලුණුවිල, ගොඩවාය , කළුගඟ , කුඹුක්කන් ඔය , මාතලේ , කුරුණෑගල , කොත්මලේ ජලාශය , හුරුළු වැව , අලිමංකඩ , හෝර්ටන් තැන්න.

II. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
මධ්‍යධරණී මුහුද , ගෝව , සියම , ඉතාලිය , බතාවිය , හිරෝෂිමා.

(ආ) I. පහත A,B,C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ගම්පොළ රාජධානි සමයේ ලංකාවට ගොඩබට චීන සෙන්පෙතියා.


B - පළමුවන පරාක්‍රමබාහු රජුගේ උත්පත්තිය සිහිවීම පිණිස පුංඛගාමයේ ඉදිකරවා ඇති දැගැබ හඳුන්වන නම.

C - පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ජාතීන්ගේ සංගමය පිහිටු වීමට මූලික වූ ඇමරිකානු ජනාධිපතිවරයා.

D - කාර්මික විප්ලව සමයේ හඳුන්වා දුන් මහා මාර්ග ඉදිකිරීමේ ක්‍රමය හැඳින් වූ නම.

II. A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. මෙහි දැක්වෙන නිර්මාණය හමුවන ස්ථානය ?
2. මෙම මාලය අයත් කාල වකවානුව කුමක් ද?
3. මෙය හමු වූ ස්ථානයේ දැකිය හැකි සොහොන් වර්ගය කුමක් ද?
4. මෙම නිර්මාණය මගින් අනාවරණය කරගත හැක්කේ කුමක් ද?



III.
1. මෙම රූපයෙන් නිරූපණය කෙරෙන රජු කවුද ?
2. එතුමා අයත් රාජ වංශය කුමක් ද?
3. එම රජතුමා වාසය කළ රජමාලිගය හැඳින් වූ නම කුමක් ද?
4. එතුමාගේ බිසවගේ නම කුමක් ද?



## II කොටස

02. I. රජරට ශිෂ්ටාචාර සමයේ මෙරටින් හමු වූ විදේශීය කාසි අයත් රටවල් තුනක් නම් කරන්න. (ල. 03)

II. පහත A සිට D දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - රජරට රාජධානි සමයේ මෙරට ශාසන ඉතිහාසය පිළිබඳ ලියවී ඇති කෘතිය.

B - ලංකාවට පැමිණ පෘතුගීසි මූලාශ්‍රයක් එළි දැක්වූ කතුවරයා

C - සකස් කරගත් ගල් කුළුණු මත ලියූ ලිපි.

D - අශ්ව හිස හා මිනිසා දැක්වෙන මූර්තිය දැකිය හැකි ස්ථානය.

(ගිරිලිපි , ටැම්ලිපි , ෆර්නාඕ ඩී ක්වෙරෝස් , රිබෙයිරෝ , රාජාවලිය , නිකාය සංග්‍රහය , ඉසුරුමුණිය , මහමෙව්නා උයන ) (ල. 04)

III. මහා වංශයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 05)

IV. ඉතිහාසය ගොඩනැගීමේ දී පුරා විද්‍යාත්මක මූලාශ්‍රයන්හි වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

03. I. ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා පිෂ්ටය ලබා ගැනීමට භාවිත කළ ශාකමය ආහාර තුනක් ලියා දක්වන්න. (ල. 03)

II. මහාවංශයේ සඳහන් වාපි ගම්මාන හතරක් ලියා දක්වන්න. (ල. 04)

III. උඩරංචාමඩම නිවසෙන් හමුවන සාධක ඇසුරෙන් පූර්ව ඓතිහාසික යුගයේ මිනිසාගේ ජීවන රටාවේ දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

IV. පූර්ව ඓතිහාසික යුගයේ සංස්කෘතිය හැදෑරීමට යොදාගත හැකි මහාශිලා සුසාන සම්ප්‍රදායට අයත් සුසාන විධි තුනක් පිළිබඳව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

04. I. අතීත ශ්‍රී ලංකාවේ රජවරුන්ගේ ක්‍රියාකලාපය හා ඔවුන් පෙනී සිටීමට උත්සහ කළ ස්වරූපය අනුව රාජ්‍යත්වය පිළිබඳ ගොඩනැගී ඇති සංකල්ප තුනක් ලියා දක්වන්න. (ල. 03)

II. වැව් ප්‍රපතනයක් නිර්මාණය කිරීමේ අරමුණු දෙකක් නම් කරන්න. (ල. 04)

III. අතීත සමාජයේ ගමික නම් තනතුරට පුද්ගලයෙකු පත් වූ ආකාරය දක්වා එම තනතුරු මගින් ඉටු කළ කාර්යයන් දෙකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

IV. වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

05. I. දහතුන් වන සියවස දක්වා මෙරට ක්‍රියාත්මක වූ දකුණු ඉන්දියානු සම්භවයක් ඇති වෙළඳ සංවිධාන තුනක් නම් කරන්න. (ල. 03)

II. පහත A සිට D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - පැරණි කාලයේ දිග මැනීම සඳහා භාවිත කළ කුඩාම ඒකකය.

B - වෙර බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා මෙවලම් තැනීමේ තාක්ෂණය හැඳින් වූ නම.

C - වංශ කතා වලට අනුව රෝහල් දහඅටක් ඉදිකර ඇතැයි සඳහන් වන රජතුමා.

D - ශ්‍රී ලංකාවේ වර්තමානයේ භාවිත වන නීතිය සම්පාදනය කිරීමට පදනම් වූ නීති ක්‍රමය හඳුන්වන නම.

III. අතීත ශ්‍රී ලංකිකයන් ජල කළමනාකරණයේ දී යොදාගනු ලැබූ උපක්‍රම දෙකක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

IV. අතීතයේ පාලකයන් සමාජයේ යහපත උදෙසා නීතිය හා සම්ප්‍රදාය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි. එසේ නීති පැනවූ ක්ෂේත්‍ර තුනක් දක්වා උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

06. I. ක්‍රි.ව. 1215 දී පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත් සමඟ ප්‍රදේශිය පාලකයන් විසින් පිහිටුවන ලද පාලන මධ්‍යස්ථාන තුනක් නම් කරන්න. (ල. 03)

II. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ල. 04)

III. ගම්පොල රාජ්‍ය සමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

IV. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමා ලංකාවේ දේශපාලන එක්සත්භාවය ඇති කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

07. I. ප්‍රංශ ජාතිකයන් විසින් ඉන්දියාවේ පිහිටුවනු ලැබූ වෙළඳ මධ්‍යස්ථාන තුනක් නම් කරන්න. (ල. 03)

II. ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසින්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු දෙකක් ලියා දක්වන්න. (ල. 04)

III. 1818 පළමු නිදහස් අරගලයට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

IV. නිදහසින් පසු මෙරට ආර්ථිකය දියුණු කිරීමට රජය ගත් ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

III කොටස

08. I. පුනරුද සමයේ සිටි මානවවාදී ගත් කතුවරු තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

II. පුනරුද යුගයේ දියුණුවට පත් ක්ෂේත්‍ර ගණනාවක තොරතුරු පහත දැක්වේ. ඒ හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - මුද්‍රණ යන්ත්‍රය නිපද වීම.

B - ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම.

C - කිරිගරුඩින් නෙලා ඇති ලොරෙන්සෝ මෙඩිසිගේ ප්‍රතිමාව නිර්මාණය.

D - ලෙඩ රෝග සෑදීමට තුඩු දුන් හේතු සොයා ගැනීම. (ල. 04)

III. පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් දෙකක් දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

IV. පුනරුදය ඇති වීමට බලපෑ හේතු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

09. I. දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ අක්ෂ පක්ෂයට අයත් රටවල් තුන මොනවා ද? (ල. 03)

II. වර්සෙල්ස් ගිවිසුම මගින් ජර්මනියට පමුණුවන ලද දඩුවම් දෙකක් ලියා දක්වන්න. (ල. 04)

III. පළමුවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)


IV. එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය රැකීම සඳහා ගත් ප්‍රයත්න තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 06)

ඉතිහාසය II
வரலாறு II
History II

විභාග අංකය
சுட்டெண்
Index No

ශ්‍රේණිය
தரம்
Grade

1. (අ) i
1. (அ) i
1. (a) I



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)

